# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 2023 අංක 11 දරන ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කළේ 2023 අගෝස්තු මස 21 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

2023 අගෝස්තු මස 25 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකි ය.

**මිල :** රු. 30.00 තැපැල් ගාස්තුව **:** රු. 150.00

මෙම පනත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## 2023 අංක 11 දරන ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2023 අගෝස්තු මස 21 වන දින]

එල්.ඩී.—ඕ. 17/2022

### 1988 අංක 40 දරන ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු පනත සංශෝධනය කිරීම පිණිස වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ.

**1.** මේ පනත 2023 අංක 11 දරන ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය

**2.** 2015 අංක 14 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1988 අංක 40 දරන ඔට්ටු ඇල්ලීම හා සූදු බදු පනතේ 2 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:- 1988 අංක 40 දරන පනතේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) එම වගන්තියේ (1අ) වන උපවගන්තියේ:-

(අ) (අ) වන ඡේදයේ "අනුපාතයකට අනුව වූ; හෝ" යන වචන වෙනුවට "අනුපාතයකට අනුව වූ;" යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) එම උපවගන්තියේ (ආ) වන ඡේදයේ "2015 ජනවාරි මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන සෑම වර්ෂයක් සඳහා ම සියයට දහයක අනුපාතයකට අනුව වූ" යන වචන සහ ඉලක්කම් වෙනුවට "2015 ජනවාරි මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන එහෙත් 2023 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව අවසන් වන සෑම වර්ෂයක් සඳහා ම සියයට දහයක අනුපාතයකට අනුව වූ; හෝ" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(ඇ) එම උපවගන්තියේ (ආ) වන ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන්:-

"(ඇ) 2023 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන සෑම වර්ෂයක් සඳහා ම සියයට පහළොවක අනුපාතයකට අනුව වූ,";

(ඇ) එම උපවගන්තියේ "දළ එකතුව මත" යන වචන වෙනුවට "දළ එකතුව මත (මෙහි මින් මතු "දළ එකතුව මත බද්ද" යනුවෙන් සඳහන් කරනු ලබන)" යන වචන ආදේශ කිරීමෙන්;

(ඉ) එම උපවගන්තියේ පළමු අතුරු විධානයේ "2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත යටතේ එකතු කළ අගය මත බද්ද හෝ 2009 අංක 9 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනත යටතේ ජාතිය ගොඩනැගීමේ බද්ද" යන වචන සහ ඉලක්කම් වෙනුවට "2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත යටතේ වූ එකතු කළ අගය මත බද්ද, 2009 අංක 9 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනත යටතේ වූ ජාතිය ගොඩනැගීමේ බද්ද හෝ 2022 අංක 25 දරන සමාජ ආරක්ෂණ දායකත්ව බදු පනත යටතේ වූ සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(2) එම වගන්තියේ (1අඅ) වන උපවගන්තියේ "2015 ජනවාරි මස 1 වන දින හෝ ඉන්පසුව" යන වචන සහ ඉලක්කම්වල සිට "බද්දක් අයකරනු ලැබිය යුතු යː" යන වචන සහ ඉලක්කම් දක්වා වන සියලු වචන සහ ඉලක්කම් ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්ː-

"(1අඅ) සූදු ව්‍යාපාරය පවත්වාගෙන යනු ලබන සෑම තැනැත්තකු විසින් ම (මෙහි මින් මතු "කැසිනෝ ඇතුළු වීමේ බද්ද" යනුවෙන් සඳහන් කරනු ලබන) බද්දක් එකතු කර එම බදු මුදල 4 වන වගන්තියේ සඳහන් එක් එක් අදාළ වාරිකයක් සඳහා මේ වගන්තියේ (1ආ) වන උපවගන්තියේ (ආ) වන ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව කොමසාරිස් ජනරාල්වරයා වෙත පහත පරිදි ගෙවනු ලැබිය යුතු ය. එනම්ː-

(අ) 2015 ජනවාරි මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන එහෙත් 2023 අප්‍රේල් මස 1 වන දිනයට පෙරාතුව අවසන් වන කාලසීමාව තුළ

දී එම සූදු ව්‍යාපාරය පවත්වාගෙන යනු ලබන ස්ථානයට ඇතුළු වන යම් තැනැත්තකුගෙන් එක්සත් ජනපද ඩොලර් සියයක හෝ එයට සමාන පරිවර්තනය කළ හැකි වෙනත් ව්‍යවහාර මුදලකින් හෝ ශ්‍රී ලංකාවේ ව්‍යවහාර මුදලින් කැසිනෝ ඇතුළු වීමේ බද්ද අයකරනු ලැබිය යුතු ය; සහ

(ආ) 2023 අප්‍රේල් මස 1 වන දින සිට හෝ ඉන්පසුව ආරම්භ වන කාලසීමාව තුළ දී එම සූදු ව්‍යාපාරය පවත්වාගෙන යනු ලබන ස්ථානයට ඇතුළු වන ශ්‍රී ලාංකික පුරවැසියකු වන යම් තැනැත්තකුගෙන් එක්සත් ජනපද ඩොලර් පනහක් හෝ එයට සමාන පරිවර්තනය කළ හැකි වෙනත් ව්‍යවහාර මුදලකින් හෝ ශ්‍රී ලංකාවේ ව්‍යවහාර මුදලින් කැසිනෝ ඇතුළු වීමේ බද්ද අයකරනු ලැබිය යුතු ය.";

(3) එම වගන්තියේ (1ආ) වන උපවගන්තියේ-

(අ) (1අ) වන උපවගන්තිය සහ (1අඅ) වන උපවගන්තිය යටතේ බද්ද ගෙවීමට යටත් වන සෑම තැනැත්තකු විසින් ම-" යන වචන සහ ඉලක්කම් වෙනුවට "(1අ) වන උපවගන්තිය යටතේ දළ එකතුව මත බද්ද ගෙවීමට යටත් වන සෑම තැනැත්තකු ම සහ (1අඅ) වන උපවගන්තිය යටතේ කැසිනෝ ඇතුළුවීමේ බද්ද එකතු කර ගෙවීමට යටත් වන සෑම තැනැත්තකු විසින් ම-" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(ආ) එම උපවගන්තියේ (ආ) වන ඡේදයේ "ප්‍රේෂණය කරනු ලැබිය යුතු ය." යන වචන වෙනුවට "කොමසාරිස් ජනරාල්වරයා වෙත ගෙවනු ලැබිය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන්;

(4) එම වගන්තියේ (1ඇ) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්:-

"(1ඇ) (අ) (1) වන සහ (1අ) වන උපවගන්තිවල සඳහන් බදු ගෙවීමට සහ (1අඅ) වන උපවගන්තියේ සඳහන් කැසිනෝ ඇතුළු වීමේ බද්ද එකතු කර ගෙවීමට යටත්වන යම් තැනැත්තකු විසින් එසේ අයකරනු ලබන බදු එකතු කර ගෙවීම පැහැර හරිනු ලබන අවස්ථාවක දී, එම පැහැරහැරීම සම්බන්ධයෙන් අදාළ පරිදි, 4 වන වගන්තියේ (2) වන, (3) වන, (4) වන, (5) වන, (5අ) වන සහ (6) වන උපවගන්තිවල සඳහන් විධිවිධාන අදාළ විය යුතු ය.; සහ

(ආ) (1අඅ) වන උපවගන්තිය යටතේ වූ බද්ද එකතු කිරීමේ සහ ගෙවීමේ ක්‍රමය සහ කාර්ය පටිපාටිය අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය හැකි ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 2අ වන වගන්තිය සංශෝධනය කිරීම

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 2අ වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්ති ඇතුළත් කිරීමෙන්:-

"(1අ) 2 වන වගන්තියේ (1) වන උපවගන්තියේ සඳහන් සූදු ව්‍යාපාරය පවත්වාගෙන යනු ලබන සෑම තැනැත්තකු ම 2010 අංක 17 දරන කැසිනෝ ව්‍යාපාර (නියාමනය කිරීමේ) පනතේ 2 වන වගන්තිය යටතේ නිකුත් කරනු ලබන බලපත්‍රයක් ලබා ගැනීම සඳහා හිමිකම් ලැබිය යුතු අතර, එම සෑම තැනැත්තකු ම එම බලපත්‍රය නිකුත් කිරීමේ දින සිට මාස එකක කාලයක් ඇතුළත දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි විය යුතු ය:

එසේ වුව ද, සූදු ව්‍යාපාරය සඳහා 2010 අංක 17 දරන කැසිනෝ ව්‍යාපාර (නියාමනය කිරීමේ) පනතේ 2 වන වගන්තිය යටතේ වූ එකී බලපත්‍රයක් ලබාගෙන ඇති සහ මේ පනත බලාත්මක වන දිනයට පෙරාතුව දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී නොමැති යම් තැනැත්තකු මේ පනත ක්‍රියාත්මක වන දින සිට මාසයක් ඇතුළත දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි විය යුතු ය:

එසේ ම තවදුරටත්, මේ වගන්තියේ කාර්ය සඳහා සූදු ව්‍යාපාරය යන්නට, කැසිනෝ ක්‍රීඩාවක දී සූදු දැමීමට අවස්ථා සැපයීම අදාළ වේ.

(1ආ) 2 වන වගන්තියේ (1) වන උපවගන්තියේ සඳහන් බුකීකරුවකුගේ ව්‍යාපාරය පවත්වාගෙන යනු ලබන සෑම තැනැත්තකු විසින් ම, එම ව්‍යාපාරය ආරම්භ කිරීමේ දින සිට මාසයක් ඇතුළත දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි විය යුතු ය:

එසේ වුව ද, මේ පනත ක්‍රියාත්මක වීමට පෙරාතුව බුකීකරුවකුගේ ව්‍යාපාරය ආරම්භ කර ඇති එහෙත් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී නොමැති යම් තැනැත්තකු මේ පනත ක්‍රියාත්මක වන දින සිට මාසයක් ඇතුළත දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි විය යුතු ය";

(2) එම වගන්තියේ (2) වන උපවගන්තියේ "(1) වන උපවගන්තිය යටතේ ලියාපදිංචි වූ" යන වචන සහ ඉලක්කම් වෙනුවට "(1) වන, (1අ) වන සහ (1ආ) වන උපවගන්ති යටතේ ලියාපදිංචි වූ" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(3) එම වගන්තියේ (3) වන උපවගන්තියේ "(1) වන උපවගන්තියේ" යන වචන සහ ඉලක්කම් වෙනුවට "(1) වන, (1අ) වන සහ (1ආ) වන උපවගන්තිවල" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්.

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:- ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) එම වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්:-

"(2) 2 වන වගන්තියේ (1) වන සහ (1අ) වන උපවගන්තිවල සඳහන් බදු ගෙවීමට සහ (1අඅ) වන උපවගන්තියේ සඳහන් කැසිනෝ ඇතුළුවීමේ බද්ද එකතු කර ගෙවීමට යටත් වන යම් තැනැත්තකු විසින්-

(අ) යම් කාලසීමාවක් සඳහා සහකාර කොමසාරිස්වරයකු විසින් තක්සේරු කරන ලද තක්සේරු නිවේදනයේ නිශ්චිතව දක්වා ඇති දිනයේ දී හෝ එදිනට පෙරාතුව ගෙවීමට නියමිත එම වගන්තියේ (1අ) වන උපවගන්තියේ සඳහන් දළ එකතුව මත වූ බද්ද හෝ එහි යම් කොටසක් ගෙවීම; හෝ

(ආ) මේ පනතේ නිශ්චිතව දක්වා ඇති දිනවල දී හෝ එම දිනවලට පෙරාතුව පිළිවෙළින් (1) වන, (1අ) වන සහ (1අඅ) වන උපවගන්තිවල සඳහන් බදු වාරිකයක් හෝ එහි යම් කොටසක් හෝ දළ එකතුව මත වූ බද්ද හෝ එහි යම් කොටසක් ගෙවීම හෝ කැසිනෝ ඇතුළු වීමේ බද්ද එකතු කර ගෙවීම,

පැහැර හැරියහොත්, එය (අ) වන හෝ (ආ) වන ඡේද යටතේ නිශ්චිතව දක්වා ඇති එම බදු, බදු වාරිකය හෝ එහි යම් කොටසක් ගෙවීම පැහැර හැරීමක් විය යුතු වන අතර එම බදු එකතු කර ගෙවීමට යටත් වන තැනැත්තා මේ පනතේ කාර්ය සඳහා බදු පැහැර හරින්නකු විය යුතු ය.";

(2) එම වගන්තියේ (3) වන උපවගන්තියේ -

(අ) "බද්දේ යම් වාරිකයක් ගෙවීම පැහැර හැර ඇති අවස්ථාවක-," යන වචන වෙනුවට "2 වන වගන්තියේ පිළිවෙළින් (1) වන, (1අ) වන සහ (1අඅ) වන උපවගන්තිවල සඳහන් බදු වාරිකයක් හෝ එහි යම් කොටසක් හෝ දළ එකතුව මත බද්ද හෝ එහි යම් කොටසක් හෝ කැසිනෝ ඇතුළු වීමේ බද්ද ගෙවීම පැහැර හැර ඇති අවස්ථාවක දී," යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(ආ) එම උපවගන්තියේ (අ) වන ඡේදයේ "ගෙවිය යුතු වාරිකයක් සම්බන්ධයෙන්" යන වචන වෙනුවට "2 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ ගෙවිය යුතු බදු වාරිකයක් සම්බන්ධයෙන්" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්; සහ

(ඇ) එම උපවගන්තියේ (ආ) වන ඡේදයේ "ගෙවිය යුතු වාරිකයක් සම්බන්ධයෙන්" යන වචන වෙනුවට "2 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ ගෙවිය යුතු බදු වාරිකයක් සම්බන්ධයෙන්" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(3) එම වගන්තියේ (3) වන උපවගන්තියේ (ආ) වන ඡේදයේ අතුරු විධානයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන්:-

"(ඇ) පැහැර හැරීම 2 වන වගන්තියේ (1අ) වන සහ (1අඅ) වන උපවගන්ති යටතේ ගෙවිය යුතු බදු සම්බන්ධයෙන් වන අවස්ථාවක දී, බදු පැහැර හරින්නා විසින්, පැහැර හැර ඇති බද්දට අතිරේකව-

(i) එම බද්දෙන් සියයට දහයකට සමාන දඩ මුදලක්; සහ

(ii) එම බද්ද පැහැර හැරීම ආරම්භ වන අවස්ථාවේ සිට දින තිහක කාලයක් අවසන් වීමට පෙරාතුව එම බදු මුදල ගෙවා නොමැති අවස්ථාවක දී, එම පැහැර හැරීම පවතින කාලසීමාව තුළ දී තවදුරටත් වූ එක් එක් දින තිහක කාලසීමාවක් හෝ ඉන් කොටසක් සඳහා, පැහැර හරින ලද බද්දෙන් සියයට දහයකට සමාන තවදුරටත් වූ, දඩ මුදලක්,

ගෙවනු ලැබිය යුතු ය:

එසේ වුව ද, කිසිදු අවස්ථාවක දී, මේ ඡේදය යටතේ දඩයක් වශයෙන් ගෙවිය යුතු මුළු මුදල පැහැර හැර ඇති බද්දෙන් සියයට පනහක් නොඉක්මවිය යුතු ය.";

(4) එම වගන්තියේ (4) වන උපවගන්තියේ "පැහැර හැර ඇති යම් වාරිකයක්" යන වචන වෙනුවට "පැහැර හැර ඇති, 2 වන වගන්තියේ පිළිවෙළින් (1) වන, (1අ) වන සහ (1අඅ) වන උපවගන්තිවල සඳහන් කර ඇති, අවස්ථාවෝචිත පරිදි, යම් බදු මුදලක යම් වාරිකයක් හෝ එහි කොටසක් හෝ දළ එකතුව මත බද්ද හෝ එහි කොටසක් හෝ කැසිනෝ ඇතුළු වීමේ බද්ද" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(5) එම වගන්තියේ (5) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත සඳහන් අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන්:-

"(5අ) (5) වන උපවගන්තියේ විධිවිධානවලට අමතරව 2018 අප්‍රේල් මස 1 දින හෝ ඉන් පසුව ආරම්භ වන අදාළ තක්සේරු වර්ෂය සඳහා පිළිවෙළින් පරිපාලන විධිවිධාන, වාර්තා තබාගැනීම සහ තොරතුරු රැස්කිරීම, බදු වාර්තා, තක්සේරු කිරීම, විරෝධතා සහ අභියාචනා, බදු සඳහා බැඳීම සහ බදු ගෙවීම, පොලිය, බදු අයකර ගැනීම, දණ්ඩන, අපරාධ නඩු කටයුතු, නියෝග සහ අර්ථ

නිරූපණ සඳහා අදාළ වන 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ IX, X, XI, XII, XIII, XIV, XV, XVI, XVII, XVIII, XIX සහ XX යන පරිච්ඡේදවල සඳහන් විධිවිධාන, මේ පනත යටතේ පිළිවෙළින් පරිපාලන විධිවිධාන, වාර්තා තබාගැනීම සහ තොරතුරු රැස්කිරීම, බදු වාර්තා, තක්සේරු කිරීම, විරෝධතා යන අභියාචනා, බදු සඳහා බැඳීම සහ බදු ගෙවීම, පොලිය, බදු අයකර ගැනීම, දණ්ඩන, අපරාධ නඩු කටයුතු, නියෝග සහ අර්ථ නිරූපණ සම්බන්ධයෙන් අවශ්‍ය වෙනස්කම් සහිතව අදාළ කරගනු ලැබිය යුතු ය.";

(6) 2015 අංක 14 දරන ඔට්ටු ඇල්ලීමේ සහ සූදු බදු පනතින් ඇතුළු කරන ලද (6) වන උපවගන්තිය ඉවත් කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ උපවගන්තියේ (අ) වන ඡේදයේ "දේශීය ආදායම් බදු පනතේ 190 වන වගන්තිය" යන වචන සහ ඉලක්කම් වෙනුවට "ව්‍යාපාර පිරිවැටුම් බදු පනතේ 38 වන වගන්තිය" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(2) ඒ උපවගන්තියේ (ආ) වන ඡේදයේ "දේශීය ආදායම් බදු පනතේ 214 වන වගන්තිය හෝ 215 වන වගන්තිය" යන වචන සහ ඉලක්කම් වෙනුවට "ව්‍යාපාර පිරිවැටුම් බදු පනතේ 42 වන වගන්තිය හෝ 43 වන වගන්තිය" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(3) ඒ උපවගන්තියේ (ඇ) වන ඡේදයේ "දේශීය ආදායම් බදු පනතේ 209 වන වගන්තිය" යන වචන සහ ඉලක්කම් වෙනුවට "ව්‍යාපාර පිරිවැටුම් බදු පනතේ 57 වන වගන්තිය" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(4) ඒ උපවගන්තියේ (ඉ) වන ඡේදයේ "දේශීය ආදායම් බදු පනතේ 209 වන වගන්තිය" යන වචන සහ ඉලක්කම් වෙනුවට "ව්‍යාපාර පිරිවැටුම් බදු පනතේ 57 වන වගන්තිය" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය සංශෝධනය කිරීම

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) "කොමසාරිස් ජනරාල්වරයා" සහ "නියෝජ්‍ය කොමසාරිස්" යන යෙදුමේ අර්ථ නිරූපණය ඉවත් කිරීමෙන්;

(2) "බුකීකරු" යන යෙදුමේ අර්ථ නිරූපණය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අර්ථ නිරූපණය ආදේශ කිරීමෙන්:-

""බුකීකරුවකු" යන්නෙන්, ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත තරග වදිනු ලබන හෝ තරග වැදීමට යෝජනා කරනු ලබන තුරඟ තරග සඳහා හෝ ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත පවත්වනු ලබන හෝ පැවැත්වීමට යෝජනා කරනු ලබන යම් ක්‍රීඩා ඉසව්වක් වෙනුවෙන්-

(අ) කෙලින් ම හෝ අන්‍යාකාරයකින්;

(ආ) මුදලට හෝ ණයට; හෝ

(ඇ) අන්තර්ජාලය හරහා ඔට්ටු භාරගන්නා වූ හෝ සාකච්ඡා කරන්නා වූ තැනැත්තකු අදහස් වේ;";

(3) "ව්‍යාපාරය" යන යෙදුමේ අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන අර්ථ නිරූපණ ඇතුළත් කිරීමෙන්:-

""කැසිනෝ" යන්නට, 2010 අංක 17 දරන කැසිනෝ ව්‍යාපාර (නියාමනය කිරීමේ) පනත යටතේ ඒ අර්ථ නිරූපණයට දී ඇති අර්ථයම තිබිය යුතු ය;

"ශ්‍රී ලංකාවේ පුරවැසියකු" යන්නට, (349 වන අධිකාරය වූ) පුරවැසි පනත යටතේ ශ්‍රී ලංකාවේ පුරවැසියකුගේ තත්ත්වය දරන තැනැත්තකු අදහස් වේ;

"කොමසාරිස් ජනරාල්වරයා" සහ "නියෝජ්‍ය කොමසාරිස්වරයා" යන යෙදුම්වල ඒවාට පිළිවෙළින් ව්‍යාපාර පිරිවැටුම් බදු පනතේ 59 වන වගන්තියෙන් ඊට දී ඇති අර්ථ ම තිබිය යුතු ය;";

(4) "සූදු" යන යෙදුමේ අර්ථ නිරූපණයේ "පුද්ගලයන්ට ඇතුළු විය හැකි" යන වචන වෙනුවට "තමා ම ඉදිරිපත් වීමෙන් හෝ අන්තර්ජාලය හරහා පුද්ගලයන්ට ඇතුළු විය හැකි" යන වචන ආදේශ කිරීමෙන්.

**7.** 2023 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වී මේ පනත සම්බන්ධයෙන් කථානායකවරයාගේ සහතිකය ඔහුගේ අත්සන ඇතිව සටහන් කරනු ලබන දිනයෙන් අවසන් වන කාලසීමාව තුළ දී, ප්‍රධාන ප්‍රඥප්තිය යටතේ බලය දෙනු ලැබූ කොමසාරිස් ජනරාල්වරයා වලංගු කිරීම

හෝ යම් තැනැත්තකු විසින් ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තියේ (1ආ) වන උපවගන්තිය යටතේ යම් තැනැත්තකුගෙන් අයකරනු ලැබූ සහ (1අඅ) වන උපවගන්තිය යටතේ යම් තැනැත්තකුගෙන් අයකර එකතු කර ගනු ලැබූ බදු මුදල් සියලු කාර්යයන් සඳහා මේ පනත යටතේ කොමසාරිස් ජනරාල්වරයා හෝ එම තැනැත්තා විසින් වලංගු ලෙස අයකර එකතු කරගනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය:

එසේ වුව ද, ඉහත කී විධිවිධාන, එකී කාලසීමාව තුළ දී අයකර ගනු ලැබූ සහ එකතු කරගනු ලැබූ එම බදු මුදල් සම්බන්ධයෙන් යම් අධිකරණයක් විසින් නිකුත් කරන ලද යම් තීරණයකට හෝ ආඥාවකට හෝ යම් අධිකරණයක විභාග වෙමින් පවත්නා නීති කෘත්‍යයකට බල නොපෑ යුතු ය.

ප්‍රධාන ප්‍රඥප්තියේ උපලේඛනය ප්‍රතියෝජනය කිරීම

8. ප්‍රධාන ප්‍රඥප්තියේ උපලේඛනය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන උපලේඛනය ආදේශ කරනු ලැබේ:-

"උපලේඛනය

[2 වන වගන්තිය]

1 වන කොටස

බුකීකරුවකු ලෙස ව්‍යාපාරය කරගෙන යන තැනැත්තකු විසින් මෙහි I වන තීරුවේ නිශ්චිතව සඳහන් සෑම වර්ෂයක් සඳහා ම ගෙවිය යුතු බදු මුදල් ප්‍රමාණය මෙහි II වන තීරුවේ අනුරූප සටහනේ නිශ්චිතව සඳහන් මුදල හා සමාන මුදලක් විය යුතු ය

| I වන තීරුව | II වන තීරුව |
|---|---|
| *වර්ෂය* | *බදු මුදල් ප්‍රමාණය* |
| 1. 1988 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව එහෙත් 2001 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භ වන සෑම වර්ෂයක් සඳහා ම බුකීකරුවකුගේ ව්‍යාපාරය කරගෙන යාම සඳහා | රුපියල් එක් ලක්ෂයක් |
| 2. 2001 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව එහෙත් 2002 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භ වන සෑම වර්ෂයක් සඳහා ම බුකීකරුවකුගේ ව්‍යාපාරය කරගෙන යාම සඳහා | රුපියල් මිලියන එකක් |

| I වන තීරුව | II වන තීරුව |
|---|---|
| *වර්ෂය* | *බදු මුදල් ප්‍රමාණය* |
| 3. 2002 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව එහෙත් 2005 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භ වන සෑම වර්ෂයක් සඳහා ම බුකීකරුවකුගේ ව්‍යාපාරය- | |
| (i) සජීවී රූපවාහිනී විකාශන පහසුකම් භාවිතා කිරීම මගින් සිදු කරන අවස්ථාවක | රුපියල් තිස්දහසක් |
| (ii) සජීවී රූපවාහිනිය විකාශන පහසුකම් භාවිතා නොකර සිදු කරන අවස්ථාවක | රුපියල් දස දහසක් |
| 4. 2005 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව එහෙත් 2006 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භවන සෑම වර්ෂයක් සඳහා ම බුකීකරුවකුගේ ව්‍යාපාරය- | |
| (i) අනුයෝජිතයකු මාර්ගයෙන් සිදු කරනු ලබන අවස්ථාවක | රුපියල් මිලියන එකක් |
| (ii) සජීවී රූපවාහිනී විකාශන පහසුකම් භාවිතා කිරීමෙන් සිදු කරන අවස්ථාවක | රුපියල් දෙලක්ෂ පනස් දහසක් |
| (iii) සජීවී රූපවාහිනී විකාශන පහසුකම් භාවිතා නොකර සිදු කරන අවස්ථාවක | රුපියල් විසිපන් දහසක් |
| 5. 2006 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව එහෙත් 2013 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භවන සෑම වර්ෂයක් සඳහා ම බුකීකරුවකුගේ ව්‍යාපාරය- | |
| (i) අනුයෝජිතයකු මාර්ගයෙන් සිදු කරනු ලබන අවස්ථාවක | රුපියල් මිලියන එකක් |
| (ii) සජීවී රූපවාහිනී විකාශන පහසුකම් භාවිතා කිරීමෙන් සිදු කරන අවස්ථාවක | රුපියල් තුන් ලක්ෂයක් |
| (iii) සජීවී රූපවාහිනී විකාශන පහසුකම් භාවිතා නොකර සිදු කරන අවස්ථාවක | රුපියල් පනස් දහසක් |

| I වන තීරුව | II වන තීරුව |
| --- | --- |
| *වර්ෂය* | *බදු මුදල් ප්‍රමාණය* |
| 6. 2013 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව එහෙත් 2015 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භවන සෑම වර්ෂයක් සඳහා ම බුකීකරුවකුගේ ව්‍යාපාරය-: | |
| (i) අනුයෝජිතයකු මාර්ගයෙන් සිදු කරනු ලබන අවස්ථාවක | රුපියල් මිලියන දෙකක් |
| ii) සජීවී රූපවාහිනී විකාශන පහසුකම් භාවිතා කිරීමෙන් සිදු කරන අවස්ථාවක | රුපියල් තුන් ලක්ෂයක් |
| (iii) සජීවී රූපවාහිනී විකාශන පහසුකම් භාවිතා නොකර සිදු කරනු ලබන අවස්ථාවක | රුපියල් විසිපන් දහසක් |
| 7. 2015 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන එහෙත් 2023 අප්‍රේල් මස 1 වන දිනට පෙර අවසන් වන සෑම වර්ෂයක් සඳහා ම බුකීකරුවකුගේ ව්‍යාපාරය- | |
| (i) අනුයෝජිතයකු මාර්ගයෙන් සිදු කරනු ලබන අවස්ථාවක | රුපියල් මිලයන හතරක් |
| (ii) සජීවී රූපවාහිනී විකාශන පහසුකම් භාවිතා කිරීමෙන් සිදු කරන අවස්ථාවක | රුපියල් හය ලක්ෂයක් |
| (iii) සජීවී රූපවාහිනී විකාශන පහසුකම් භාවිතා නොකර සිදු කරනු ලබන අවස්ථාවක | රුපියල් පනස් දහසක් |
| 8. 2023 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භවන සෑම වර්ෂයක් සඳහා ම බුකීකරුවකුගේ ව්‍යාපාරය- | |
| (i) අනුයෝජිතයකු මාර්ගයෙන් හෝ අන්තර්ජාලය හරහා සජීවී රූපවාහිනී විකාශන පහසුකම් භාවිතා කිරීමෙන් හෝ නොකිරීමෙන් සිදු කරනු ලබන අවස්ථාවක | රුපියල් මිලියන පහක් |
| (ii) සජීවී රූපවාහිනී විකාශන පහසුකම් භාවිතා කිරීමෙන් සිදු කරන අවස්ථාවක | රුපියල් මිලියන එකක් |

| I වන තීරුව | II වන තීරුව |
|---|---|
| *වර්ෂය* | *බදු මුදල් ප්‍රමාණය* |
| (iii) සජීවී රූපවාහිනී විකාශන පහසුකම් භාවිතා නොකර සිදු කරනු ලබන අවස්ථාවක | රුපියල් හැත්තෑපන්දහසක් |

II වන කොටස

සූදු ව්‍යාපාරයක් කරගෙන යන තැනැත්තකු විසින් මෙහි I වන තීරුවේ නිශ්චිතව සඳහන් සෑම වර්ෂයක් සඳහා ම ගෙවිය යුතු බදු මුදල් ප්‍රමාණය මෙහි II වන තීරුවේ අනුරූප සටහනේ නිශ්චිතව සඳහන් මුදල හා සමාන මුදලක් විය යුතු ය.

| I වන තීරුව | II වන තීරුව |
|---|---|
| *වර්ෂය* | *බදු මුදල් ප්‍රමාණය* |
| 1. 1988 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව එහෙත් 2001 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භ වන සෑම වර්ෂයක් සඳහා ම සූදු ව්‍යාපාරය කරගෙන යාම සඳහා | රුපියල් මිලියන එකක් |
| 2. 2001 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව එහෙත් 2002 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භ වන සෑම වර්ෂයක් සඳහා ම සූදු ව්‍යාපාරය කරගෙන යාම සඳහා | රුපියල් මිලියන විසිපහක් |
| 3. 2002 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව එහෙත් 2005 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භ වන සෑම වර්ෂයක් සඳහා ම සූදු ව්‍යාපාරය කරගෙන යාම සඳහා- | |
| (i) (රූජිනෝ ක්‍රීඩාව කිරීම හැර) සූදු ව්‍යාපාරය කරගෙන යාම සඳහා | රුපියල් මිලියන දොළහක් |
| (ii) රූජිනෝ ක්‍රීඩාව පමණක් ක්‍රීඩා කිරීම සඳහා | රුපියල් පන් ලක්ෂයක් |

| I වන තීරුව | II වන තීරුව |
|---|---|
| *වර්ෂය* | *බදු මුදල් ප්‍රමාණය* |
| 4. 2005 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව එහෙත් 2013 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භ වන සෑම වර්ෂයක් සඳහා ම රූජිනෝ ක්‍රීඩාව ක්‍රීඩා කිරීම ඇතුළුව සූදු ව්‍යාපාරයක් කරගෙන යාම සඳහා | රුපියල් මිලියන පනහක් |
| 5. 2013 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව එහෙත් 2015 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භ වන සෑම වර්ෂයක් සඳහා ම රූජිනෝ ක්‍රීඩාව ක්‍රීඩා කිරීම ඇතුළුව සූදු ව්‍යාපාරයක් කරගෙන යාම සඳහා | රුපියල් මිලියන සියයක් |
| 6. 2015 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන එහෙත් 2023 අප්‍රේල් මස 1 වන දිනට පෙර අවසන් වන සෑම වර්ෂයක් සඳහා ම රූජිනෝ ක්‍රීඩාව ක්‍රීඩා කිරීම ඇතුළුව සූදු ව්‍යාපාරයක් කරගෙන යාම සඳහා | රුපියල් මිලියන දෙසීයක් |
| 7. 2023 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන සෑම වර්ෂයක් සඳහා ම රූජිනෝ ක්‍රීඩාව ක්‍රීඩා කිරීම ඇතුළුව සූදු ව්‍යාපාරයක් කරගෙන යාම සඳහා | රුපියල් මිලියන පන්සීයක් |

.”.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**9.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත්, අංක 118, දෙස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08,
රජයේ මුද්‍රණාලයේ පිහිටි "ප්‍රකාශන පියස" හි දී මිල දී ගත හැකි ය.